# RUAF - CFF Project

## Pilot City - Gampaha

### අනාගතය සඳහා කෘෂිකර්මයේ නියුතු
### ගම්පහ නගරය



නාගරික කෘෂිකර්ම - ක්ෂේත්‍ර චාරිකාව

*නාගරික හරිත බලකාය* - 2008.09.01

නාගරික හරිත බලකාය

සාමාජික ආයතන

- මහ නගර සභාව - ගම්පහ
- පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - බස්නාහිර පළාත් සභාව
- පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - බස්නාහිර පළාත් සභාව
- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - බස්නාහිර පළාත් සභාව
- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - බස්නාහිර පළාත් සභාව
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
- උද්භිද උද්‍යානය ගම්පහ
- සණස නගර බැංකුව

ප.ව. 1.45 ආරම්භය
සාකෙත උත්සව ශාලාව

ප.ව. 2.00 මැදගම iii ග්‍රාමනිලධාරිවසම
සුහද මාවත

ප.ව. 3.00 මැදගම iv ග්‍රාමනිලධාරිවසම
උසාවිපාර

ප.ව. 3.45 බැණ්ඩියමුල්ල නැගෙනහිර
අශෝක උයන

ප.ව. 4.30 සමාලෝචනය
ශ්‍රීබෝධිපෙදෙස



## 1. සුහද මාවතේ සුහද පිළිගැනීම

ඉතා මෑතකදී නාගරික කෘෂිකර්මයට පළමු පියවර තැබූ සුහද මාවතේ නගර වැසියන් අද වන විට පියවරින් පියවර ඉදිරියට යමින් , ඉමහත් උද්යෝගයෙන් තමන්ට ලැබුණු පැල , බීජ සහ අනෙකුත් සම්පත් ආයක කරගනිමින් තම අඩු ඉඩකඩ ඵලදායි ලෙස යොදාගැනීම ට ඇති හැකියාව අවබෝධකර ගන්නා ආකාරය ප්‍රශංසනීය බව ඔබටද දැනෙනු ඇත. මෙම මාවතෙහි නිවෙස් 18 ක් නාගරික හරිත බලකායහි මග පෙන්වීමෙන් RUAF - CFF ව්‍යාපෘතිය තුල ප්‍රතිලාභ ලබයි.

දෙමාපියන් ව්‍යාපෘතියට සම්බන්ධවීම සමඟ නාගරික කෘෂිකර්මයට එකතුවීමට අවස්ථාව ලබන , පාසල් සිසු දරු දැරියන් කිහිපදෙනකුම තම අසල් වැසියන්හටද පූර්වාදර්ශ සපයමින් හා නොමසුරු සහයෝගය දක්වමින් තම නිවෙස් බිම්හි වගාවන් සඳහා ඉහළ දායකත්වයක් දැක්වීමද මෙම කණ්ඩායම තුල කැපීපෙනෙන කරුණකි. ඔවුන්ගේ වගා ක්ෂෙත්‍රයන්හි සියළු ක්‍රියාකාරකම් , පුහුණු උපදෙස්, ගැටළු හා නිරීක්ෂණ සටහන් කිරීම ප්‍රයෝජනවත් බවට අප ලබා දුන් පණිවිඩය පහසුවෙන් ක්‍රියාත්මක තත්වයට යොමුකරගැනීමටත් , එය අන් අය තුලට ව්‍යාප්ත වීමටත් මෙම දරුවන් ගේ උත්සාහය විශේෂයෙන් හේතුවී ඇත.

මෙම කෘෂිකාර්මික ප්‍රයත්නය මෙම නාගරික සමාජය තුළ ට ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය, ආර්ථික සවිබලයට අමතරව සහයෝගීතාවය, එකමුතුබව ඒක රාශී කිරීමටත්, ඔවුන්ගේ කටුක වටා පිටාව සිහිල් හරිත පැහයට සමීප කරන්නටත්, ඔවුන්ගේ කාලය ඵලදායි කටයුත්තකට යොමු කිරීමට හා සැඟවී තිබුණු නිර්මාණශීලීත්වය අවධි කිරීමටත් සමත්ව ඇති බව අපේ හැඟීමයි.

2. ප්‍රජා නායකත්වය - නාගරික කෘෂිකර්ම අත්දැකීම් බෙදාගැනීම හා මගපෙන්වීම
මැදගම iv ග්‍රාම නිලධාරී වසම - උසාවිපාර

මීලඟට ඔබ පිවිසෙන්නේ ක්‍රමවත්ව පිළියල කරන ලද සශ්‍රික සුන්දර ගෙවත්තකටයි. ගම්පහ නගරයට මෙම ව්‍යාපෘතිය පිලියල කිරීම ආරම්භ කෙරුනු මුල් වකවානු වලදීම ප්‍රජා සහභාගීත්වය නියෝජනය කරමින් අප හා රැඳි හඳුනාගත් නාගරික කෘෂිකර්ම ප්‍රයත්නයන් එම අවධියේම තම නිවෙස් බිමෙහි ස්ථාපනය කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල අත්කරගත් සරත් හඳුන්ගේ මහත්මා තම මාවතේ අසල්වැසියන් හට ව්‍යාපෘතිය තුළ වඩාත් ශක්තිමත්ව කටයුතු කරන්නට සහයෝගය දක්වන්නේ ද මහත් ඕනෑ කමිනි.

නාගරික කෘෂිකාර්මික ක්‍රියාකාරකම් ප්‍රජාව තුළ ප්‍රචලිත කිරීමට හා අවශ්‍ය තාක්ෂණය හඳුන්වාදීමට ගම්පහ නාගරික හරිත බලකායේ නිලධාරී මහත්ම මහත්මීන්ට මෙම ප්‍රජා නායකත්වයන් තුලින් පහසුකම් සැලසේ.

කෘෂිකාර්මික ක්‍රියාකාරකම් කෙරෙහි දක්වන කැමැත්තත්, කැපවීමත් එතුලින් නිවෙස් බිමෙහි ඉදිවන සුන්දර උද්‍යානය සිතට තිළිණ කරන මානසික සතුට හා අභිමානයත්, මෙපමණ යැයි මිනුම් කළ නොහැක. මෙම ආදර්ශය ආදර්ශයක් කරගත් බොහෝ පිරිස් ව්‍යාපෘති අධාර තුල නාගරික කෘෂිකර්මයෙහි පළමු පියවර තබමින් ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමේ අරමුණු ඇතිව තම නිවෙස් බිම් සංවර්ධනයට එක්ව සිටීමද ජයග්‍රහණයකි.

ශ්‍රී.

3. පවුලේ ආහාර වේලට ගෙවත්තෙන් යමක් දෛනිකවම එකතු කරගන්නා සීමිත ඉඩකඩ ජයගත් අසල් වැසියෝ

බැණ්ඩියමුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම - අශෝක උයන

ඉතාමත් කුඩා ඉඩකඩක් තුළ පවුලේ පෝෂණයට දායක වන බොහෝ බෝගයන් එක්තැන් කළ අසල් වාසීන් දෙදනකු වන වීරරත්න මහත්මාගේ හා ගුණතිලක මහත්මාගේ නිවෙස් බිම් වල සුන්දරත්වය අත්විඳින්නයි මීලගට අපේ සූදානම. පවුලේ සියලු දෙනාගේම දායකත්වයෙන් නිමවී ඇති මේ නිවෙස් බිම් වගාවන් නිසැකයෙන්ම පවුලේ ශ්‍රමය, පවුලේ අය ප්‍රිය කරන බෝග වගාවට එකතු කරගෙන තිබෙන අවස්ථාවක්.

බෝග වගාවට තිබෙන කැමැත්තත් , දෛනිකව තම ආහාර වේලට ගෙවත්තෙන් යමක් එකතු කිරීමේ වටිනාකමත් අවබෝධවීම සමඟ විසිතුරු මල් පැල බඳුන් වෙනුවට එළවළු වගා බඳුන් ඉඩකඩ ඇති සෑමතැනම රැඳවූ ඔවුන් නිසි තාක්ෂණික මගපෙන්වීම ලබාගන්නේ මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධවීම සමඟම නාගරික කෘෂිකර්ම විභවයන් හඳුනා ගනිමිනි.

## 4. ලෙන්ගතු පරිසරයක - සමාලෝචනයට පොඩි ඉඩක්

### ශ්‍රී බෝධි පෙදෙස

තාක්ෂණය හඳුනාගත් වහාම එම දැනුම ක්ෂේත්‍රයේ අත්හදා බලන්නට උනන්දුවූණ මැණිකේ මහත්මිය කෘෂිකර්මයට් තිබෙන ඇගේ කැමැත්තත් ,හැකියාවත් නාගරික කෘෂිකාර්මික ක්‍රියා කාරකම් තුලින් නිවෙස් බිමට සුන්දර අයුරින් එකතු කරගන්නට සමත්වී තිබෙනවා. ශ්‍රී බෝධි පෙදෙසෙහි අසල්වැසියන්ට ආදර්ශයක් වන ලෙස වගා ව්‍යුහ , පැල බඳුන් සකස් කරගන්නත් , පුහුණු වැඩසටහන් ,ප්‍රායෝගික ක්‍රියාකාරකම් [illegible]ගා නාගරික හරිත බලකායට සහයවෙන්නත් ඇය කාලය වෙන්කර ගත්තේ නොපැකිලවමයි.

මේ ඔබ රැඳී සිටින්නේ ඇගේ නිවසේ ඉදිරිපස මිදුලේ නොවෙයි. නමුත් ඇය පිළිවලට සකස් කල මේ ඉඩකඩ අපේ ක්ෂේත්‍ර චාරිකාවේ අවසන් සමාලෝචනයට සුවදායක පරිසරයක් සකස් කරදෙනු ඇත.